කොවිඩ්-19 ආසාදිත රෝගියෙකු මියගිය අවස්ථාවේදී විශේෂයෙන්ම ආදාහනය සිදු කරන දර්ශන පෙන්වීමේදී අදාළ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම මගින් සහ ආදාහනය කිරීමට සූදානම් වන අවස්ථාවේදී එම මෘත ශරීරය බහාලූ පෙට්ටිය ආදාහනාගාරයට ඇතුලත් කර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ පිරිස් ඇඳ සිටි ආරක්ෂිත කබා සහ අත්වැසුම් ආදිය ඉවත්කර ඒ තුලට දමන දර්ශන මගින් මියගිය පුද්ගලයාට යම් අගෞරවයක් සිදුවන බැවින්, එම තත්වය මග හරවා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය නම් දේහය සුසාන භූමිය වෙත රැගෙන එන දර්ශන පමණක් විකාශය කරන ලෙස කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති නිර්දේශ ඔස්සේ රජය මාධ්‍ය වෙතින් ඉල්ලා සිටී.
මෙසේ ඉල්ලීමක් සිදුවන්නේ, මියගිය අයෙකුට මෙවැනි දර්ශනයන් විකාශය කිරීම ඔස්සේ සිදුවිය හැකි යම් අගෞරවයක් වැළැක්වීම සහ එසේම මියගියවුන්ගේ සමීපතමයන්ට ඇතිවිය හැකි සිත් වේදනාවන් වැළැක්වීමටයි. එය එසේ වුවත්, හිරු සහ ස්වර්ණවාහිනී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන් ඔස්සේ (05/05) මෙම නිර්දේශගත ඉල්ලීම නොසලකා හැර ඇති අයුරු දක්නට ලැබිණි.
කොවිඩ්-19 පසුතලයේ මෙවැනි නිර්දේශ කඩ නොකිරීමට මාධ්‍ය වගකීම් සහගත විය යුතු නොවේද? ඒ අනුව ආදාහනාගාරයට ගෙන යන මෘතදේහයන් සහ ගෙනයෑමට සූදානම්ව තිබෙනා මෘතදේහයන් පෙන්වීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් නොවේද?
මූලාශ්‍ර:
https://mcusercontent.com/.../76820bda-4513-4f3d-9d49...
#MediaEthicsSL #lka #SinhalaNews #HiruTV